තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

ජාතික තරුණ සේවා සභාව

ඇබෑර්තු

තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ජාතික තරුණ සේවා සභාවේ පහත තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. ප්‍රධාන අභ්‍යන්තර විගණක - (HM 1-1) - පුරප්පාඩු සංඛ්‍යාව 01

- **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් වාණිජ / ගණකාධිකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම. **සහ**

(i) අදාළ ක්ෂේත්‍රයකින් ලබාගත් පිළිගත් පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම. **හෝ**

(ii) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම. (ICASL) **හෝ**

(iii) වරලත් ගණකාධිකාරීන්ගේ කළමනාකරණ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම. (CIMA) **හෝ**

(V) සහතික කළ සහ සමායත්ත ගණකාධිකාරීන්ගේ සංගමයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම. (ACCA) **සහ**

(ආ) උපාධිය/ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රාජ්‍ය ආයතනයක/සංස්ථාවක / මණ්ඩලයක/ ව්‍යවස්ථාපිත ආයතනයක/පිළිගත් වාණිජ ආයතනයක, කළමනාකාර මට්ටමේ මූල්‍ය /ගිණුම් පිළිබඳ ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් වසර පහළොවක (15) පළපුරුද්දක් ලබා තිබීම.

- **වයස් සීමාව**

❖ අවුරුදු 35 ට නොඅඩුව හා අවුරුදු 55 ට නොවැඩි අය විය යුතුය.

- **HM 1-1 වැටුප් හා දීමනා**

HM 1-1 - 02/2016 රු 80,295 - 15 X 2,270 - 114,345/-

2. සහකාර අධ්‍යක්ෂ - (MM 1-1) - පුරප්පාඩු සංඛ්‍යාව 14

- **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

(අ) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් මිනුම් උපාධියක් ලබා තිබීම. **සහ**

(ආ) උපාධිය හෝ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රාජ්‍ය ආයතනයක / සංස්ථාවක / මණ්ඩලයක / ව්‍යවස්ථාපිත ආයතනයක / පිළිගත් වාණිජ ආයතනයක, තරුණ සේවා සංවිධානය / ප්‍රජා සංවිධානය / සමූපකාර කටයුතු / ග්‍රාම සංවිධානය පිළිබඳ ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

3. සහකාර අධ්‍යක්ෂ (මුදල්) - (MM 1-1) - පුරප්පාඩු සංඛ්‍යාව 02

- **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

(අ) (i) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් වාණිජ / ගණකාධිකරණය පිළිබඳ (සිංහල මාධ්‍ය / දෙමළ මාධ්‍ය) උපාධියක් ලබා තිබීම. **හෝ**

(ii) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ අන්තර් මධ්‍ය මට්ටම සමත්ව තිබීම. (ICASL-Intermediate Level). **හෝ**

(iii) වරලත් ගණකාධිකාරීන්ගේ කළමනාකරණ ආයතනයේ අන්තර් මධ්‍ය මට්ටම සමත්ව තිබීම. (CIMA). **හෝ**

(iv) වරලත් සහතික කළ සමායත්ත ගණකාධිකාරීන්ගේ සංගමයේ අන්තර් මධ්‍ය මට්ටම සමත්ව තිබීම. (ACCA) **හෝ**

(V) රජයේ කාර්මික විද්‍යාලයක ගණකාධිකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම. **සහ**

(ආ) උපාධිය හෝ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රාජ්‍ය ආයතනයක / සංස්ථාවක / මණ්ඩලයක / ව්‍යවස්ථාපිත ආයතනයක / පිළිගත් වාණිජ ආයතනයක, මූල්‍ය / ගිණුම් කටයුතු පිළිබඳ ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් වසරක (01) සේවා පළපුරුද්දක් ලබා තිබීම.

4. ඉංජිනේරු (සිවිල්) - (MM 1-1) - පුරප්පාඩු සංඛ්‍යාව 01

(අ) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් සිවිල් ඉංජිනේරු උපාධියක් ලබා තිබීම. **සහ**

(ආ) උපාධිය හෝ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රාජ්‍ය ආයතනයක / සංස්ථාවක / මණ්ඩලයක / ව්‍යවස්ථාපිත ආයතනයක / පිළිගත් වාණිජ ආයතනයක, සිවිල් ඉංජිනේරු කටයුතු පිළිබඳ ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

- **වයස් සීමාව**

❖ අවුරුදු 22 ට නොඅඩුව හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

- **MM 1-1 වැටුප් හා දීමනා**

MM 1- 1 - 02/2016 රු 53,175 - 10 X 1,375 - 15 X 1,910 - 95,375/-

5. වැඩපොළ අධිකාරී - (JM 1-1) - පුරප්පාඩු සංඛ්‍යාව 01

- **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් සිවිල් ඉංජිනේරු / යාන්ත්‍රික ඉංජිනේරු / ස්වයංචලන ඉංජිනේරු උපාධියක් ලබා තිබීම.

6. කාර්මික නිලධාරී - (JM 1-1) - පුරප්පාඩු සංඛ්‍යාව 01

- **අධ්‍යාපන සුදුසුකම්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් යාන්ත්‍රික ඉංජිනේරු උපාධියක් ලබා තිබීම.

7. නිෂ්පාදක - (JM 1-1) - පුරප්පාඩු සංඛ්‍යාව 01

- **අධ්‍යාපන සුදුසුකම්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් කලා උපාධියක් ලබා තිබීම.

8. ප්‍රසම්පාදන නිලධාරී - (JM 1-1) - පුරප්පාඩු සංඛ්‍යාව 01

- **අධ්‍යාපන සුදුසුකම්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් උපාධියක් ලබා තිබීම. විෂයක් වශයෙන් සැපයීම් ඇතුළත් විම.

9. මූල්‍ය නිලධාරී - (JM 1-1) - පුරප්පාඩු සංඛ්‍යාව 03

- **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් වාණිජ / ගණකාධිකරණය පිළිබඳ (සිංහල / දෙමළ මාධ්‍ය) උපාධියක් ලබා තිබීම. **හෝ**

(ii) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ අන්තර් මධ්‍ය මට්ටම සමත්ව තිබීම. (ICASL-Intermediate Level) **හෝ**

(iii) වරලත් ගණකාධිකාරීන්ගේ කළමනාකරණ ආයතනයේ අන්තර් මධ්‍ය මට්ටම සමත්ව තිබීම. (CIMA) **හෝ**

(iv) වරලත් සහතිකලත් ගණකාධිකාරිවරුන්ගේ සංගමයේ අන්තර් මධ්‍ය මට්ටම සමත්ව තිබීම. (ACCA) **හෝ**

(V) රජයේ කාර්මික විද්‍යාලයක ගණකාධිකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා සහතියක් ලබා තිබීම.

10. අභ්‍යන්තර විගණන නිලධාරී - (JM 1-1) - පුරප්පාඩු සංඛ්‍යාව 01

- **අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්**

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් වාණිජ / ගණකාධිකරණය පිළිබඳ (සිංහල / දෙමළ මාධ්‍ය) උපාධියක් ලබා තිබීම. **හෝ**

(ii) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ අන්තර් මධ්‍ය මට්ටම සමත්ව තිබීම. (ICASL-Intermediate Level) **හෝ**

(iii) වරලත් ගණකාධිකාරීන්ගේ කළමනාකරණ ආයතනයේ අන්තර් මධ්‍ය මට්ටම සමත්ව තිබීම. (CIMA) **හෝ**

(iv) වරලත් සහතිකලත් ගණකාධිකාරිවරුන්ගේ සංගමයේ අන්තර් මධ්‍ය මට්ටම සමත්ව තිබීම. (ACCA) **හෝ**

(V) රජයේ කාර්මික විද්‍යාලයක ගණකාධිකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා සහතියක් ලබා තිබීම.

- **වයස් සීමාව**

❖ අවුරුදු 22 ට නොඅඩුව හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

- **JM 1-1 වැටුප් හා දීමනා**

JM 1- 1 - 02/2016 රු 42,600 - 10 X755 - 15 X 1,135 - 70,350/-

11. උපදේශන සේවා නිලධාරී - (MA - 4) - පුරප්පාඩු සංඛ්‍යාව 02

- **අධ්‍යාපන සුදුසුකම්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් අධ්‍යාපනය / සමාජ විද්‍යාව පිළිබඳව උපාධියක් ලබා තිබීම.

- **වයස් සීමාව**

❖ අවුරුදු 22 ට නොඅඩුව හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

- **MA 4 වැටුප් හා දීමනා**

MA 4 - 02/2016 රු 37,970 - 10X755 - 15X930 - 5X1,135 - 65,145/-

12. කලා ශිල්පී (සංගීත / නැටුම්) - (MA 2-1) - පුරප්පාඩු සංඛ්‍යාව 07

- **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

(i) කලා ශිල්පී (සංගීත)

තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය යෝග්‍යතා (NVQ) පහ (05) වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. **හෝ**

සංගීතය පිළිබඳ ලලිතකලායතනයේ ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම. **හෝ**

භාත්කණ්ඩේ අවසාන විභාගය (විශාරද අවසාන) සමත් වී තිබීම. **හෝ**

ගාන්ධර්ව අවසාන විභාගය සමත් වී තිබීම. **හෝ**

බටහිර සංගීතය පිළිබඳ රාජකීය හෝ ත්‍රිත්ව විභාගය 05 වන මට්ටම සමත් වී තිබීම. **හෝ**

අත්තාමලේ විශාරද විභාගය සමත් වී තිබීම.

(ii). කලා ශිල්පී (නැටුම්)

තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය යෝග්‍යතා (NVQ) පහ (05) වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. **හෝ**

නැටුම් පිළිබඳ ලලිතකලායතනයේ ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම. **හෝ**

භාත්කණ්ඩේ අවසාන විභාගය (විශාරද අවසාන) සමත් වී තිබීම. **හෝ**

ගාන්ධර්ව අවසාන විභාගය සමත් වී තිබීම. **හෝ**

අත්තාමලේ විශාරද විභාගය සමත් වී තිබීම.

13. සහකාර පුස්තකාලයාධිපති - (MA 2-1) - පුරප්පාඩු සංඛ්‍යාව 01

- **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ ජාතික වෘත්තීය යෝග්‍යතා (NVQ) පහ (05) වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

14. සහකාර නිෂ්පාදක - (MA 2-1) - පුරප්පාඩු සංඛ්‍යාව 01

- **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්, ලේඛන කලාව සහ සන්නිවේදන (Writer Ship and Communication) ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය යෝග්‍යතා (NVQ) 05 වන මට්ටමට නොඅඩු, ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

15. කාර්මික සහකාර (විද්‍යුත් / සිවිල් / විදුලි) - (MA 2-1) - පුරප්පාඩු සංඛ්‍යාව 01

- **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

(i) කාර්මික සහකාර (සිවිල්)

තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්, සිවිල් ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය යෝග්‍යතා (NVQ) 05 වන මට්ටමට නොඅඩු, සහතිකයක් ලබා තිබීම.

(ii) කාර්මික සහකාර (විදුලි)

තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්, විදුලි ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය යෝග්‍යතා (NVQ) 05 වන මට්ටමට නොඅඩු, සහතිකයක් ලබා තිබීම.

(iii) කාර්මික සහකාර (විද්‍යුත්)

තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්, ඉලෙක්ට්‍රොනික ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය යෝග්‍යතා (NVQ) 05 වන මට්ටමට නොඅඩු, සහතිකයක් ලබා තිබීම.

16. ජල දෘඩාංග කාර්මික ශිල්පී - (MA 2-1) - පුරප්පාඩු සංඛ්‍යාව 01

- **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ජල දෘඩාංග කාර්මික ශිල්පයට අදාළව කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය යෝග්‍යතා (NVQ) පහ (05) වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

17. ගොවිපළ සහකාර - (MA 2-1) - පුරප්පාඩු සංඛ්‍යාව 04

- **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්, කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය යෝග්‍යතා (NVQ) 05 වන මට්ටමට නොඅඩු, කෘෂිකාර්මික ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

සටහන: කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මෙහෙයවන (මාස 06 ක) ප්‍රායෝගික පුහුණු පාඨමාලාව සාර්ථක ලෙස නිම කර තිබීම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

18. වෘත්තීය පුහුණු උපදේශක - (MA 2-1) - පුරප්පාඩු සංඛ්‍යාව 19

- **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත්, සිවිල් / විදුලි / ඉලෙක්ට්‍රොනික ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය යෝග්‍යතා (NVQ) 05 වන මට්ටමට නොඅඩු, තාක්ෂණවේදය (NDT) පිළිබඳ ජාතික ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම. **හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද, සිවිල් / විදුලි / ඉලෙක්ට්‍රොනික ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය යෝග්‍යතා (NVQ) 05 වන මට්ටමට නොඅඩු, ඉංජිනේරු විද්‍යාව (NDES) පිළිබඳ ජාතික ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම.

හෝ

තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කෘෂිකර්ම / ක්‍රීඩා / කාර්මික / වායු සමීකරණ / ආලෝකකරණ / පෙදරේරු / ජල නළ / වඩු වැඩ / තොරතුරු තාක්ෂණය / වෙනත් අදාළ ක්ෂේත්‍රයක ජාතික වෘත්තීය යෝග්‍යතා (NVQ) 05 වන මට්ටමට නොඅඩු සහතිකයක් ලබා තිබීම.

19. පරිගණක චිත්‍රක නිර්මාණ ශිල්පී - (MA 2-1) - පුරප්පාඩු සංඛ්‍යාව 02

- **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිල්පයට අදාළව පරිගණක චිත්‍ර නිර්මාණ ශිල්පය විෂයක් වශයෙන් ඇතුළත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය යෝග්‍යතා (NVQ) පහ (05) වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

- **වයස් සීමාව**

❖ අවුරුදු 18 ට නොඅඩුව හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

- **වැටුප් හා දීමනා**

MA 2-1-02/2016 රු 30,310-10X300-07X350-04X495-20X660-50,940/-

20. කළමනාකරණ සහකාර - (MA 1-1) - පුරප්පාඩු සංඛ්‍යාව 70

- **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

(අ) සිංහල / දෙමළ හා ගණිතය ද, තවත් විෂයන් 02 ක් ද ඇතුළු විෂයයන් 04 කට සම්මාන සහිතව එකවර විෂයයන් 06 කින් අ.පො.ස.(සා.පෙ.) විභාගය සමත්ව තිබීම. **සහ**

(ආ) අ.පො.ස.(උ. පෙ.) විභාගයෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) විෂයන් 03 කින් සමත්ව තිබීම.

21. සහකාර තරුණ සේවා නිලධාරී - (MA 1-1) - පුරප්පාඩු සංඛ්‍යාව 52

- **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

(අ) සිංහල / දෙමළ හා ගණිතය ද, තවත් විෂයන් 02 ක් ද ඇතුළු විෂයයන් 04 කට සම්මාන සහිතව එකවර විෂයයන් 06 කින් අ.පො.ස. (සා.පෙ.) විභාගය සමත්ව තිබීම. **සහ**

(ආ) අ.පො.ස.(උ. පෙ.) විභාගයෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) විෂයන් 03 කින් සමත්ව තිබීම.

(ඇ) තනතුරට විශේෂිත වෙනත් අවශ්‍ය සුදුසුකම්

ජාතික තරුණ සේවා සභාවේ යොවුන් සමාජ ක්‍රියාකාරී සාමාජිකයෙකු ලෙස අවම වශයෙන් වසර දෙකක් (02) වත් කටයුතු කර තිබීම.

22. නිවාස පාලිකාව - (MA 1-1) - පුරප්පාඩු සංඛ්‍යාව 11

- **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

(අ) සිංහල / දෙමළ හා ගණිතය ද, තවත් විෂයන් 02 ක් ද ඇතුළු විෂයයන් 04 කට සම්මාන සහිතව එකවර විෂයයන් 06 කින් අ.පො.ස.(සා.පෙ.) විභාගය සමත්ව තිබීම. **සහ**

(ආ) අ.පො.ස.(උ. පෙ.) විභාගයෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) විෂයන් 03 කින් සමත්ව තිබීම.

(ඇ) තනතුරට විශේෂිත වෙනත් අවශ්‍ය සුදුසුකම්

රාජ්‍ය ආයතනයක / සංස්ථාවක / මණ්ඩලයක / ව්‍යවස්ථාපිත ආයතනයක / ප්‍රකට වාණිජ ආයතනයක පාලිකාවක සේ අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම අනිවාර්ය සුදුසුකමක් ලෙස සැලකේ.

- **වයස් සීමාව**

❖ අවුරුදු 18 ට නොඅඩුව හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

- **වැටුප් හා දීමනා**

MA 1-1-02/2016 රු 27,910-10X300-07X350-04X495-20X660-45,540/-

- 02/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛයේ විධිවිධාන අනුව 2021 වර්ෂයේ පත්වීම් ලබන දින සිට අදාළ වැටුප් පරිමාණයට හිමිකම් ලබන අතර, තනතුරට අදාළව රජයේ අනුමත යෙනකුන් දීමනා ගෙවනු ලැබේ.
- ස්ථිර තනතුරකි.සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිතය.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය : 2021.05.03

- **පොදු කොන්දේසි**
  - ➢ ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
  - ➢ අදාළ තනතුරු සඳහා අයදුම්පත් **"සභාපති/අධ්‍යක්ෂ ජනරාල්, ජාතික තරුණ සේවා සභාව, අංක 65, හයිලෙවල් පාර, මහරගම"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් යොමු කළ යුතුය.
  - ➢ අයදුම්පත් යොමු කිරීමේදී ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවර ඔබ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.
  - ➢ ඉල්ලුම්කරන තනතුරට අදාළ කාර්යභාරය මනාවින් ඉටුකිරීමට හැකි, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවයක් තිබිය යුතුය.
  - ➢ විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
  - ➢ අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයකින්ම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.
  - ➢ අයදුම්පත සමඟ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්වල සහතික කළ ඡායාපිටපත් අමුණා එවිය යුතුයි.
  - ➢ අයදුම්පතුයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.
  - ➢ ආයතනයෙහි පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන පරිදි රජයේ ගැසට් පත්‍රයේ හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම මඟින් හා ජාතික තරුණ සේවා සභාවේ වෙබ් අඩවියේ පළකිරීම මඟින් අයදුම්පත් කැඳවීමෙන් පසුව ඒ ඒ තනතුරට අදාළ වන පරිදි වූ ලිඛිත තරග විභාගයක හා / හෝ පත්වීම් බලධාරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මඟින් පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

අධ්‍යක්ෂ ජනරාල්/ සභාපති
ජාතික තරුණ සේවා සභාව, අංක 65, හයිලෙවල් පාර, මහරගම.

ආදර්ශ අයදුම් පත්‍රය

අයදුම් කරන තනතුර : ....

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

ජාතික තරුණ සේවා සභාවේ ඇබෑර්තුව පවතින තනතුරු සඳහා බඳවා ගැනීම

01.
- 1.1. අයදුම්කරුගේ මුලකුරු සමඟ නම : ....
- 1.2. සම්පූර්ණ නම : ....
- 1.3. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐
- 1.4. ස්ත්‍රී / පුරුෂ භාවය : ස්ත්‍රී ☐ පුරුෂ ☐

02.
- 2.1. ස්ථිර ලිපිනය : ....
- 2.2. දුරකථන අංකය : ....

03.
- 3.1. උපන් දිනය — වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐
- 3.2. අයදුම්පත් කැඳවන අවසන් දිනට වයස — අවුරුදු ☐☐☐☐ මාස ☐☐ දින ☐☐

04. ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම් : ....

❖ අ.පො.ස (සා/පෙළ) වර්ෂය : .... විභාග අංකය : ....

විෂය	සාමාර්ථය

❖ අ.පො.ස (උ/පෙළ) වර්ෂය : .... විභාග අංකය : ....

විෂය	සාමාර්ථය

4.1. වෘත්තීය සුදුසුකම් : ....

පාඨමාලාවේ නම	නිපුණතා මට්ටම	ආයතනය

05. ඔබ කවර හෝ වෙරදකාරත්වයක් සඳහා උසාවියකින් වරදකරු දඬුවම් ලැබ තිබේද ? (අදාළ කොටුවේ (√) ලකුණ යොදන්න)

ඔව්		නැත	

එසේ දඬුවම් ලැබ ඇත්නම්, ඒ කුමන වරදක් සඳහා කවර අධිකරණයකින් කවර දඬුවමක් ලැබ ඇත් ද යන තොරතුරු සපයන්න :- ....

06. අයදුම්කරුගේ සහතිකය : ....

(අ) මෙම ඉල්ලුම් පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් තොරතුරක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් විය හැකි අලාභය විඳ දරා ගැනීමට මම එකඟ වෙමි. තවද මෙහි සියළුම තොරතුරු නිවැරදිව සම්පූර්ණ කර ඇති බවද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශනය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත්වීම් ලැබීමට නුසුදුස්සෙකු වන බවත් පත්වීම් ලැබීමෙන් පසුව වුව ද තනතුරෙන් ඉවත්කිරීමට යටත් වන බවත් මම දනිමි.

(ඇ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය : ....
අයදුම්කරුගේ අත්සන

07. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

.... යන ලිපිනයේ පදිංචි .... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන අයෙකු බවත්, ඔහු/ඇය .... දින මා ඉදිරිපිටදී අත්සන යෙදූ බව සහතික කරමි.

....
අත්සන හා නිල මුද්‍රාව

නම : ....
තනතුර : ....
දිනය : ....